විෂය - විද්‍යාව
9 ශ්‍රේණිය

සැකසුම - කේ.කේ.පී.ඒ.කේ. කොහොඹකන්ද.
පාසල - ර/නිවි/ යායින්න විද්‍යාලය.

❖ **ඒකක ඇගයීම. කාලය පැය - 02කි.**

පෙළ පොත හොඳින් කියවා පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු ලකුණු කරන්න.

1) දිළීර විනාශ කරනු ලබන ප්‍රතිජීවකය කුමක්ද?
   1) පෙනිසිලින්. 2) ඇමොක්සලීන්. 3) ග්‍රීසියොෆුල්වින්. 4) එරිත්‍රොමයිසීන්.

2) අවිදුර දෘෂ්ටිකත්වයට හේතුවන සාධකයකි.
   1) අක්ෂි ගෝලය දිගුවීම. 2) අක්ෂි කාචයේ වක්‍රතාව වැඩි කිරීමට නොහැකි වීම.
   3) අක්ෂි කාචය දිගුවීම. 4) අක්ෂි ගෝලයේ වක්‍රතාව අඩු කිරීමට නොහැකි වීම.

3) සෛලවල දික්වීම කෙරෙහි බලපාන ශාක වර්ධක ද්‍රව්‍යයකි.
   1) ගිබෙරලින්. 2) ඔක්සීන්. 3) සයිටොකයිනින්. 4) සයිටොසෙල්.

4) සාර්ව ප්‍රතිග්‍රාහකයකු සතු රුධිර ගණය කුමක්ද?
   1) A 2) B 3) AB 4) O

5) ආවර්ති චලනයකට නිදසුනකි.
   1) අඳුර වැටෙනවිට පත්‍ර හැකිළීම. 2) ආලෝකය වැටෙනවිට පුෂ්ප පිපීම.
   3) නිදිකුම්බා පත්‍ර ස්පර් ශ කළ විට හැකිළීම. 4) ශාක මුල් ජලය දෙසට වැඩීම.

6) බලයක රූපික නිරූපණයක් හා සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය කුමක්ද?
   1) බලයේ විශාලත්වය සරල රේඛා ඛණ්ඩයේ දිගෙන් නිරූපණය වේ.
   2) සරල රේඛාව මත ඇඳි ඊ හිසෙන් බලයේ විශාලත්වය නිරූපණය වේ.
   3) උපයෝගී ලක්ෂ්‍යය සරල රේඛාව මත සළකුණු කළ තිතකින් නිරූපණය වේ.
   4) බලයේ දිශාව සරල රේඛාව මත ඇඳි ඊ හිසෙන් නිරූපණය වේ.

7) වර්ගඵලය $4 m^2$ පෘෂ්ඨයකට අභිලම්භව 500 N බලයක් යෙදූ විට පෘෂ්ඨය මත ඇතිවන පීඩනය කොපමණද?
   1) $125 Nm^{-2}$ 2) $225 Nm^{-2}$ 3) $250 Nm^{-2}$ 4) $2000 Nm^{-2}$

8) පෘථිවියේ සම්භවය පිළිබඳව ඉදිරිපත් වූ නූතන වාදයකි.
   1) නෙබියුලා වාදය. 2) මහා පිපිරුම් වාදය.
   3) කොස්මොසොයික් වාදය. 4) ජෛව රසායනික පරිණාමය පිළිබඳ

9) සමජාතීය මිශ්‍රණයකි.
   1) අයිස් ක්‍රීම්. 2) ලුණු ද්‍රාවණය. 3) පළතුරු සළාදය. 4) බොර ජලය.

10) ශ්‍රවණ ස්නායුවේ අග්‍ර සම්බන්ධ වී ඇත්තේ කුමන ව්‍යුහයටද?

1) යුෂ්ටේකීය නාලයටය. 2) කර්ණ අස්ථිකා වලටය.
3) කර්ණ ශංඛයටය. 4) අර්ධ චක්‍රාකාර නාළ වලටය.

11) මෙම විද්‍යුත් විච්ඡේදන ක්‍රියාවලිය පිළිබඳ අසත්‍ය ප්‍රකාශය කුමක්ද?




1) ධන ඉලෙක්ට්‍රෝඩයෙන් වායු බුබුළු පිටවීම.
2) සෘණ ඉලෙක්ට්‍රෝඩය රතු දුඹුරු පැහැ ද්‍රව්‍යයක් තැන්පත් වීම.
3) ද්‍රාවණයේ නිල් පැහැය අඩු වීම.
4) සෘණ ඉලෙක්ට්‍රෝඩයෙන් වායු බුබුළු පිටවීම.

12) පරිසර පද්ධතියක දැකිය හැකි ජීවී- අජීවී සම්බන්ධතාවයකි.

1) සතුන් විසින් ශාක ආහාරයට ගැනීම. 2) ක්ෂුද්‍ර ජීවීන් ජීවී දේහ මත යැපීම.
3) ශාක පසෙන් ජලය උරා ගැනීම. 4) විලෝපිකයන් සතුන් ආහාරයට ගැනීම.

13) ඝනත්වය 800 $kgm^{-3}$ වන ද්‍රාවණයක 2 $m^3$ ක් වන පරිමාවක ද්‍රව ස්කන්ධය කොපමණද?

1) 1600kg. 2) 800kg . 3) 400kg. 4) 200kg.

14) ජල සංරක්ෂණය සඳහා අවම දායකත්වයක් පෙන්වන අවස්ථාව කුමක්ද?

1) වැව් අමුණු වාරි මාගර් තාක්ෂණය. 2) වැසි දිය ටැංකි වලට එකතු කිරීම.
3) බිංදු ජල සම්පාදන ක්‍රමය. 4) ගංගා ජලය මුහුදට ගලා යාම.

15) මෙහි දැක්වෙන ආලෝක පරාවර්තනයට උචිත පිළිතුර කුමක්ද?



1) තල දණකින් සිදුවන පරාවර්තනය.
2) ගසකින් සිදුවන පරාවර්තනය.
3) නිසල ජල පෘෂ්ඨයක පරාවර්තනය.
4) ටයිල් පෘෂ්ඨයක පරාවර්තනය.

16) දෙවන පන්තියට අයත් ලීවරයකට නිදසුනකි.

1) කතුර. 2) අඬුව. 3) ශිරය. 4) සීසෝව.

17) 400 N බරැති වස්තුවක් තල්ලු කිරීමට 200N බලයක් යොදයි.යාන්ත්‍ර වාසිය කොපමණද? 1) 1 කි. 2) 2කි. 3) 3 කි. 4) 4 කි.

18) නැනෝ මීටර 1ක් (1 nm ) සමාන වනුයේ?

1) $10^{-9}$ m. 2) $10^{-9}$ mm. 3) $10^{9}$ m. 4) $10^{9}$ mm.

19) පාෂාණයකට නිදසුනකි.

1) තිරුවාණ. 2) ඇපටයිට්. 3) රූටයිල්. 4) ග්‍රැනයිට්.

20) වලාකුළක ප්‍රදේශ 2ක්තුළ හෝ වලාකුළු 2ක් අතර සිදුවන ආරෝපණ පැනීමක්,

1) වා අකුණකි. 2) පෘථිවි අකුණකි. 3) වළා අකුණකි. 4) පියවර අකුණකි.